RANIL WICKREMESINGHE
VIII Executive President of Sri Lanka

11, Flower Road, Colombo 7, Sri Lanka

**ශෝක ප්‍රකාශය**

ශ්‍රී ලාංකේය දේශපාලනයේ විප්ලවීය චරිතයක් වූ මහින්ද විජේසේකර මහතාගේ අභාවය අසා මහත් සංවේගයට පත් වීමි.

මහින්ද විජේසේකර මහතා මා හඳුනා ගත්තේ 60 දශකයේදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු හැටියටය. මා එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනයට සම්බන්ධ වූ අතර මහින්ද විජේසේකර මහතා මුල් කාලයේදී ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයේ යෙදී පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග එක්වී රට පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සෘජු නායකත්වය ලබා දුන්නේය.

වර්ෂ 2001 වකවානුව තුළදී විජේසේකර මහතා එක්සත් ජාතික පෙරමුණ සමග එක්වී මාතර දිස්ත්‍රික්කයේ සෘජු නායකත්වය ගෙන එක්සත් ජාතික පක්ෂයට මහත් ශක්තියක් ලබා දුන් බව මම මේ අවස්ථාවේ සිහිපත් කිරීමට කැමත්තෙමි.

ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ අවුරුදු 20යි මාස හයක පළපුරුද්ද සහිත කෘතහස්ථ දේශපාලනඥයකු වූ මහින්ද විජේසේකර මහතා දේශපාලන ලෝකයේ නොමැකෙන සටහන් තැබූ අපූරු මිනිසෙකි.

දකුණේ ප්‍රබල දේශපාලනඥයකු වූ ඔහු විවිධ රජයන් යටතේ අමාත්‍ය ධුර ගණනාවක් හොබවමින් කළ සේවය අපමණය.

තැපැල් හා විදුලි සංදේශ, ධීවර සහ ජලජ සම්පත්, වනවගා, පාරිසරික නිවාස සහ නාගරික සංවර්ධන, නාවික, වරාය, පුනරුත්ථාපන ක්ෂේත්‍රයන්හි අමාත්‍යවරයකු මෙන්ම නියෝජ්‍ය අමාත්‍ය ධුර දරමින් විජේසේකර මහතා කළ මෙහෙවර අදටත් ජනතා සිත්හී නොමැකී පවතී.

වචන වලින් පමණක් නොව සැබැවින්ම විප්ලවවාදියකු වූ විජේසේකර මහතා නික්ම යන්නේ ඔහුගේ දර්ශනය ඉදිරියට ගෙන යා හැකි තරුණයකු වන කාංචන විජේසේකර දේශපාලන ලෝකයට දායාද කරමිනි.

මහින්ද විජේසේකර මහතාගේ අභාවය වෙනුවෙන් පවුලේ සැමට මගේත්, එක්සත් ජාතික පක්ෂයේත් සාතිශය සංවේගය පළ කර සිටිමි.

**රනිල් වික්‍රමසිංහ**
එක්සත් ජාතික පක්ෂ නායක,
viii වැනි විධායක ජනාධිපති.
2026 අප්‍රේල් 03